## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

කුලී වාරික ක්‍රමයට ලබාගෙන තිබූ මෝටර් රථ 05කට අදාල වටිනාකම ගණනය කර ස්ථාවර වත්කම් යටතේ පෙන්වා නොතිබුණි.

#### 1.2.2 විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම

මූල්‍ය ප්‍රකාශන වල වූ පහත දැක්වෙන එක් එක් අයිතමයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| බෙලිදෙනිය ඉඩම | 889,000 | හිමිකම් ඔප්පුව |
| නවාතැන් ආහාර පාන හා වෙනත් වියදම්( කතරගම) | 1,260,320 | සනාථ කිරීමේ ලියවිලි |

### 1.2.3 **නීතී,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**.

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 176(3) | කතරගම මැණික් ඉඩම් වෙන්දේසියේදී ලොට් අංක 21 සඳහා හිඟ ලංසු මුදල වූ රු. 2,964,625 ක් අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය | ඉතා විශේෂ කරුණු හේතුකොට ගෙන රු. 250,000 දක්වා නියමිත ලංසු කැඳවීමෙන් බැහැරවීමට අනුමැතිය දීමට ආයතන ප්‍රධානියාට බලය තිබුණත් ඊට පටහැනිව කතරගම වෙන්දේසි ඉඩමේ ආරක්ෂක වැටක් ඉදිකිරිම සඳහා ලංසු කැඳවීමකින් තොරව රු. 825,440 ක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. |
| (ඇ) | 1995 දෙසැම්බර් 18 දිනැති අංක 340(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ඡේදය | මෝටර්වාහන අපහරණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර ආයතනයේ ප්‍රධානියා, ප්‍රධාන ගණකාධිකාරි, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු හා මෝටර් රථ යාන්ත්‍රික ඉංජිනේරුවෙකුගෙන් සමන්විත තක්සේරු මණ්ඩලයක් විසින් අපහරණය කිරීමට නියමිත වාහන සම්බන්ධයෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව වාහන වෙන්දේසි කර තිබුණි. |
| (ඈ) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අනුමත ඉන්ධන ප්‍රමාණය ඉක්මවා අතිරේකව ලබාගත් රු.1,155,000 ක්වූ ඉන්ධන භාවිතය සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඉ) | 2004 අගෝස්තු 31 දිනැති ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ ජනරාල්වරයාගේ ලිපිය | පතලක් කැපීමේදී ලැබෙන මතුපිට පස් පතල වැසීමේදී යලි මතුපිටට වැටෙන සේ වසා නොතිබුණි. |
| (ඊ) | 2012 මාර්තු 9 දිනැති අංක NGJA /16-2/2012/ Bachoe -1 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ චක්‍රලේඛය | කැනීම්වලින් ලබාගන්නා ඉල්ලම් ගංගා ඇලදොළ හා ජලමාර්ග වලට වැටෙන සේ සේදීම නොකල යුතු බවට උපදෙස් දී තිබුණි.ඒ අනුව කටයුතු නොකල අවස්ථා කිහිපයක් ස්ථානිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| (උ) | 2012 දෙසැම්බර් 24 දිනැති අංක 49 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව එක් පුද්ගලයෙකුට රු.40,000 වන සේ සමාලෝචිත වර්ෂය තුළ රු.7,031,445 ක් ප්‍රසාද දීමනාද ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් රු.3,821,351 ක්ද ගෙවා තිබුණි. |

1.2.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම් යටතේ රු.1,331,949 ක ශේෂයක් වසර 02 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන යමින් පැවති අතර එකී ශේෂය තුළ වසර 05 ඉක්මවූ රු. 33,844 ක ශේෂයක් ද පැවතුණි.

(ආ) ආපසු එවූ රු. 3,475,412 ක් වටිනා චෙක්පත් 17කින් රු. 30,650ක් වූ චෙක්පත් 02ක් වසර 02කට වැඩි කාලයක සිට පැවත එන අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගෙවිය යුතු ගිණුම් යටතේ රු. 2,568,873 ක් වූ සියයට 10 රදවාගත් මුදල් (Retention Money) වසර 05කට වැඩි කාලයක සිට පැවත එන අතර එම මුදල ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර රු.350,928,300 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු වලට පෙර ශුද්ධ ලාභය රු.27,812,402 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.323,115,898 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි කතරගම ඉඩම් වෙන්දේසිය, අපනයන සේවා ගාස්තු ආදායම්, යාන්ත්‍රික පතල් කැණීම් සේවා ගාස්තු ආදායම් හා පරීක්ෂණ ගාස්තු ආදායම් පිළිවෙලින් රු.246,716,272ක්, රු.30,956,927ක්, රු.7,728,500ක් හා රු. 27,690,075කින් වැඩිවීම හේතු වී තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව අධිකාරියේ මුළු ආදායම සමාලෝචිත වර්ෂයේදී සියයට 144 කින් වැඩි වී තිබුණු අතර මුළු වියදම සියයට 82 කින් වැඩි වී තිබුණි. ශුද්ධ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය සමාලෝචිත වර්ෂයේදී රු.404,192,548 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එය රු.51,016,525 ක් වූයෙන් රු.353,176,023 කින් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජුවලරි ෂැංහයි ප්‍රදර්ශනයට වෙළඳ කුටි 22ක් වෙන්කරවා ගෙන තිබූ අතර ඉන් විදේශ සංවිධානයකට කුටි 04 ක් මුදල් අයකිරීමකින් තොරව දී තිබුණි. කුටි 03ක් භාවිතයෙන් තොරව පැවතීම නිසා රු.1,231,356 ක පාඩුවක් අධිකාරියට සිදු වී තිබුණි.

(ආ) කලවාන - කළුපාලම ඉල්ලම් ඉවත්කර ගැනීම සඳහා වැඩිම මිල වූ රු. 2,700,900 ක ලංසුවට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද බාහිර බලපෑම් මත යැයි පවසා එකී කොන්ත්‍රාත්තුව බාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රාදේශීය කළමනාකරුගේ අභිමතය පරිදි නැවත ලංසු කැඳවීමෙන් රු. 939,920 කට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර තිබුණි. ඒ අනුව අධිකාරියට රු. 1,760,980ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට අපනයන ආදායමෙන් අයකර තිබූ මුදලින් අරමුදලක් පිහිටුවා තිබූ අතර එයින් 92,498,578ක මුදලක් තත්ත්ව රසායනාගාරයක් පිහිටුවීම සඳහා 2009 අප්‍රේල් මාසයේදී පෞද්ගලික ආයතනයක් වෙත දී තිබුණද, එකී ඉදිකිරීම 2013 ජූනි මාසය වනවිටත් ඉටුකර නොතිබුණි.

(ඈ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳ කුටි කුලියට දීමෙන් 2008,2009,2010, හා 2012 වර්ෂයන් සඳහා ලැබිය යුතු මුළු කුලී ආදායම රු.4,903,336 ක් විය. එයට අමතරව ලැබිය යුතු විදුලි ගාස්තු රු.424,169 ක් වී තිබුණි.

(ඉ) මැණික් ගැරීමේ කටයුතු අවසන් වීමෙන් අනතුරුව අදාල පතල් වලවල් වසා නොතිබුණ අවස්ථාවන් නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳ අදාල බලධාරීන් සැලකිල්ලක් නොදැක්වීමෙන් මදුරු කීටයන් බෝවීමේ තත්ත්වයන් ඇතිවී තිබුණි.

(ඊ) ගංගා ඇලදොල හා ජල මූලාශ්‍ර සඳහා වෙන්කර තිබුණු රක්ෂිත ප්‍රදේශවල පතල් කැපීම නිසා පරිසරයට බරපතල හානි සිදුවී ඇති අවස්ථා නිරීක්ෂණය විය.

(උ) අනවසර පතල් කැනීම් හා අනවසරයෙන් පුපුරන ද්‍රව්‍ය යොදාගෙන ගල්බෝර කිරීමට බැකෝ යන්ත්‍ර යොදාගැනීම නිසා ජන ජීවිතයට මෙන්ම පාරිසරික ගැටළු ඇතිවී තිබුණි.

(ඌ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ කාමර 2ක් බාහිර පාර්ශවයන්ට කුලියට දී තිබුණද කුලි ගිවිසුම් නියමිත දිනට යාවත්කාලීන නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා රු.300,245 ක කුලි මුදලක් හිඟ හිටව පැවතුණි.

## 3.2 **කාර්ය මණ්ඩල පරිපාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.3.1 (viii) ඡේදය ප්‍රකාරව ආයතනයේ කලමනාකරණ තනතුරු සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මක නොවීම මත ආයතනයේ විධායක තනතුරු බොහොමයක් සඳහා තාවකාලික, කොන්ත්‍රාත්, වැඩ බැලීමේ හා වැඩ ආවරණය කිරීමේ පදනම මත පත්වීම් ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩ බැලීමේ හා වැඩ ආවරණය කිරීමේ දීමනා ලෙස විධායක තනතුරු 06ක්ද ඇතුළුව තනතුරු 07ක් සඳහා රු.729,610 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) පත්වීමක් කළ හැක්කේ අනුමත තනතුරක් සඳහා පමණක් වුවද, අනුමත තනතුරක් නොවූ අලෙවි නිලධාරී තනතුරක් සඳහා මූලික සුදුසුකම් සපුරා නොමැති නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

(ඇ) මැණික් අලෙවි ප්‍රවර්ධන උපදේශකවරයෙකු 2010 ඔක්තෝම්බර් 01 දින සිට බඳවාගෙන මාස 27කට රු.1,350,000 ක් ගෙවීම් කර තිබූ අතර නිලධාරියාගෙන් බලාපොරොත්තු වූ සේවය ලැබී නොතිබුණි.

(ඈ) අධිකාරිය පිහිටුවීමේ පනතේ 33 වගන්තිය ප්‍රකාරව ස්වකීය බලතල කාර්ය හා කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා සේවකයන්, අනුයෝජිතයන් මණ්ඩලය විසින් පත්කළ යුතු වුවත් පතල් අධීක්ෂක තනතුරු සඳහා බඳවාගැනිමේදී සියලුම ප්‍රදේශ සඳහා අනුයුක්ත කළ හැකි වන පරිදි බඳවාගැනිම් සිදුකර නොතිබුණි.

3.3 **දූෂ්‍ය අක්‍රමිකතා**

කතරගම මැණික් ඉඩම් වෙන්දේසිය සම්බන්ධ පුවත්පත් දැන්වීමට අනුව ගෙවිය යුතු අත්තිකාරම් මුදල, මුදලින් ගෙවිය යුතුව තිබූ අතර, එයට පටහැනිව වෙන්දේසියෙන් දින 12 කට පසු එක් ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් රු.2,964,625 ක චෙක්පතක් ලබාගෙන තිබුණත් එය අගරු වී තිබුණි. එම නිසා ආයතනයට සිදුවූ පාඩුව සම්බන්ධයෙන් වගකිවයුතු අධිකාරියේ නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.

3.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සම්පත්

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව වෙනත් රාජ්‍ය ආයතනයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලය ලබා දී තිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) 2010 මැයි සිට 2012 දෙසැම්බර් දක්වා කාලයට නිලධාරීන් දෙදෙනකු අමාත්‍යාංශයේ සේවයට යොදවා තිබූ අතර ඒ සඳහා රු. 1,157,539 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ආ) අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගුවන් ගාස්තු හා වෙනත් වියදම් සඳහා රු. 771,861 ක් ගෙවා තිබුණි.

(ඇ) උක්ත චක්‍රලේඛය පටහැනිව 2012 පෙබරවාරි සිට මැයි දක්වා කාල පරිච්ඡේදයට අදාලව නිලධාරීන් කිහිපදෙනෙකුට රු. 961,000 ක විශේෂ දීමනාවක් හා රු. 117,960 ක ප්‍රවාහන හා නවාතැන් සඳහා ගෙවීම් කර තිබුණි.

3.5 **සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩ නැගීම.**

පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික ගෙවීම සඳහා රු.10,848,634 ක් ප්‍රතිපාදනය කර තිබුණත් උද්ගත විය හැකි වගකීම් බේරුම් කිරීම සඳහා අරමුදල් සැපයීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනයේ කාර්ය සාධනය පහත පරිදි නිරීක්ෂණය විය.

| | ඉලක්ක ගත කාර්යය | තත්‍ය කාර්ය සාධනය |
|---|---|---|
| (i) | මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සංගණනයක් කිරීම. | පළාත් 09 ක් අතුරෙන් කොළඹ, ගම්පහ,රත්නපුර, ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක වල පමණක් සංගණනය කර තිබුණි. |
| (ii) | පරිසර හිතකාමී මැණික් කැණීමේ තාක්ෂණය දියුණුකිරීම හා හඳුන්වාදීම. | රු.මිලියන 11.2 ක් වෙන්කර තිබුණද අත්හැර දමන ලද පතල් වැසීම හා පැල සිටුවීමේ ව්‍යාපෘති වර්ෂය තුළ සිදුකර නොතිබුණි. |
| (iii) | සියළුම ස්වර්ණාභරණ නිෂ්පාදන වල වටිනා ලෝහ විශ්ලේෂණය කිරීම හා මුද්‍රා තැබීම පිළිබඳ නීතිමය වලංගගුතාවය ලබා ගැනීම. | රු.මිලියන 6.6 ක් වෙන්කර තිබුණද අපේක්ෂිත කාර්යය ඉටුකර නොතිබුණි. |
| (iv) | මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ඉල්ලුමට අවශ්‍ය හැකියාව ඇති මානව සම්පත් ඇතිකිරීම | රු.4,700,000 ක් වෙන්කර තිබුණු අතර රු.403,106 ක් එනම් ඇස්තමේන්තු වියදමින් සියයට 9 ක සේවක පුහුණු වීම සඳහා යොදවා තිබුණි. |
| (v) | නීති විරෝධී මැණික් ගැරීම් නැවැත්වීම සඳහා විශේෂ කාර්ය බලකායක් පිහිටුවීම. | නීති විරෝධී මැණික් ගැරීම් වැටලීම් මගින් රු.36,100,000 ක ඇස්තමේන්තුගත ආදායමක් ඉපයීමට සැලසුම් කර තිබුණද ඇස්තමේන්තුගත ආදායමින් සියයට 24 ක් හෙවත් රු.8,706,832 ක ආදායමක් උපයාගෙන තිබූ අතර, වැටලීම් 321 ක් පමණක් සිදුකර තිබුණි. |

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකර නොතිබුණි.

(i) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා ජාතික සැලැස්මක් ඇතිකර ගැනීම.

(ii) ගෙවුඩ අපනයනය "0" දක්වා අඩුකිරීමට පහසුකම් සැපයීම.

(iii) අපනයන ප්‍රවර්ධන මණ්ඩලය හා මැණික් ස්වර්ණාභරණ සංගමය සමඟ එක්ව 2013 වනවිට තත්ත්ව සංවර්ධන සඳහා පහසුකම් සැපයීම.

(ඇ) සංයුක්ත සැලැස්මට අනුව 2012 වර්ෂය තුළ ඉටුකළ යුතු පහත කාර්යයන් ඉටුකර නොතිබුණි.

(i) ශ්‍රී ලංකාවෙන් හමුවන මැණික් පිළිබඳව ශ්‍රී ලාංකිකයන් හා විදේශකයින් දැනුවත් කිරීම සඳහා ජාතික කෞතුකාගාරයයෙහි Gem Gallery ඇතිකිරීම.

(ii) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අවශ්‍යතාවය වෙනුවෙන් පුහුණු ආයතන වලට පහසුකම් සැපයීම.

(ඇ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 14 වන වගන්තිය අනුව පහත දැක්වෙන කාර්යයන් ඉටුකර නොතිබුණි.

(i) ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධනය ඇති කිරීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු අතර අවශ්‍ය සහයෝගය ලබාදීම.

(ii) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ වැඩකරන තැනැත්තන්ගේ සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි, විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත හා ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු ආරක්ෂක පියවර විධිමත් කිරීම සහ පාලනය කිරීම.

## 4.2 අයවැය පාලනය

-------------------

පහත කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අපනයන ප්‍රවර්ධන සැලැස්ම අනුව විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා ඇස්තමේන්තු කර තිබු මුදල රු.10,000,000 ක් වුවත් සත්‍ය වශයෙන් වැය කර තිබු මුදල රු.30,093,075 ක් විය.

(ආ) අයවැයගත දත්ත කෙරේ ලඟාවීම සියයට 16 සිට සියයට 399 දක්වා අගයක් පෙන්නුම් කිරීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 4.3 පද්ධති පාලනය

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වාහන නඩත්තුව හා පාලනය

(ඇ) මැණික් ගැරීම් බලපත්‍ර නියමයන් අධීක්ෂණය කිරීම

(ඈ) මැණික් ඉඩම් වෙන්දේසි පැවැත්වීම

(ඉ) ආදායම් පාලනය

(ඊ) මානව සම්පත් කළමනාකරණය